හේරත්, මනෝරංජන

මූර්ති කලා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*Paper: Transformability*

# 'ගම්පළ ඇම්බැක්ක දේවාලයේ මූර්ති නිමැවුම් කලාත්මක අගය අභිබවා ගිය සුවිශේෂ කලා ප්‍රකාශනයකි '

ගම්පළ යුගයට (ක්‍රි.ව. 1341 - 1410) අයත් ගෘහනිර්මාණ අංගයක් ලෙස සැලකෙන ඇම්බැක්ක දේවාලය කතරගම දෙවියන් වන්දනය වෙනුවෙන් ඉදි වූ ස්ථානයකි. ශ්‍රී ලාංකේය මූර්ති නිර්මාණ අතරැති ඉතා අගනා දැව කැටයම් සමූහයක් ඇති ස්ථානයක් ලෙස ද මෙය විශේෂ අවධානයට හා ඇගයීමට ලක්වූ තැනෙකි. මෙම නිර්මාණයන්හි පවත්නා කලාත්මක අගය සම්බන්ධයෙන් බොහෝ විචාර ලියැවී ඇත.

එහෙත් මෙම කැටයම් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ ඒවා එහි පවත්නා මූර්ති නිර්මාණාත්මක අගය ඉක්මවා ගියා වූ සංකල්ප සමුච්චයක් බවයි. ඒ අනුව, මෙම නිර්මාණ සංරචන වෙනත් පැතිකඩ ද්විත්වයක් ඇසුරින් ඇගයීමට ලක් කළ හැකි බව පෙනීයයි. ඒවා නම්:

(1)- මෙහි බොහෝ නිර්මාණ අංග දිව්‍ය වන්දනය සඳහා වෙන් වූ මෙම ස්ථානයට උචිත වූ අයුරින් සමස්ත සංරචනය පුරා සංකලනය කර තිබීම.

(11)- තත්කාලීන සමාජය පිළිබඳ විවරණයක් මෙම නිර්මාණ වස්තු විෂයයන්හි අන්තර්ගත වීම.

මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මෙම කරුණු ද්වය ආශ්‍රයෙන් දේවාල මූර්ති කැටයම් පිළිබඳව එහි නිර්මාණ සංකල්පය හා සමාජ සංස්කෘතික අගය සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් එය එම නිමැවුම්හි පවත්නා කලාත්මක පාර්ශවය අභිබවා ගිය සුවිශේෂ කලා ප්‍රකාශනයක් බව තර්කයට බඳුන් කිරීමය.